**ශීර්ෂය - 11 මුදල් කොමිෂන් සභාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මුදල් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2021 මැයි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීදැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **වියදම් කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් 50 ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොමැතිවීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් වැය විෂයයේරු. 200,000.ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | මෙම මුදල **Network AttachedStorage** පරිගණකයක් මිලදී ගැනීමට වෙන් කල අතර 2020 වර්ෂයේ රටේ පැවති කොවිඩ් තත්ත්වය හමුවේ වෙළඳපලේ භාණ්ඩ හිග වීම මත සැලසුම් කළ **NetworkAttachedStorage** පරිගණක පද්ධතිය සඳහා මිල ගණන් කැඳවනු ලැබුවත් ආයතනය විසින් මිල ගණන් ඉදිරිපත් නොකිරීම මත මෙම වැය විෂය යටතේ ප්‍රතිපාදන ඉතිරි විය. | වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කළ යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව154 (ජ)(6) ව්‍යවස්ථාව ප්‍රකාරව කොමිෂන් සභාව ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කළ යුතු වුවද එය සකස් කරගෙන නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (3) හා (4) මඟින් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා යාවලියක් මුදල් කොමිෂන් ක්‍රි ඈ සභාව සකස් කරගෙනත. | ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව154 (ජ) (6) ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | යාවලිය කාලීන එමක්‍රි තාවයන්ට ගැලපෙන අවශ්‍ය ට ලක් අයුරින් සංශෝධනයන් කරමින් ඒ අනුව මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය වාර්ෂිකවඉටු කරනු ලැබේ . | |
| (ආ) 2018 වර්ෂය ආරම්භ කර තිබුණු කොමිෂන් සභා පනත සකස් කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවසන් කර නොතිබුණි. | යෝජිත මුදල් කොමිෂන් සභා පනත සකස් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුනීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා මුදල් ශය සමඟ සාකච්ඡා අමාත්‍යාං පවත්වා එම උපදෙස් අනුව ඇ තක්ද පිළියෙල කරකෙටුම්පත. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව මූලික කෙටුම්පතේ ඇති කරුණු කාරණා සමහරක් වෙනස් විය යුතු අතර ඒ සම්බන්ධයෙන් නව කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඉදිරි කටයුතු කරනු ඇත . | පනත සකස් කිරීමේ කටයුතු සිදු කළ යුතු වීම |

## 3.2 කළමනාකරණ දුර්වලතා

------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් වාහනයක් එම අමාත්‍යාංයට භාර දෙන ලෙස ඉකුත් වර්ෂයේ සැප්තැම්බර් 30 දින කොමිෂන් සභාවට දැනුම් දී තිබුණද එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් කොමිෂන් සභාව සතුව පවතින වාහන ප්‍රමාණය සීමිත නිසා PA – 0400දරන රථය සංචිත රාජකාරි සඳහා යොදා ගන්නා අතර 2019 ඔක්තෝබර් 14 වන දිනෙන් සෞඛ්‍ය , පෝෂණ සහ ශයේ ලේකම් අමතා අමාත්‍යංදේශීය වෛද්‍ය කාර්යාලයෙන් යවන ලද ලිපිය මඟින් මෙම නව වාහනයක් අදාල වාහනය ආපසු පැවරීම ලබා ගන්නා තෙක් දීර්ඝ කරන ලෙස ඉල්ලීම් කර ඇත. | මෙම වාහනය සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතු වීම |

**4. මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 15 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. | ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු ක 02 සේවා පළාත් සභා හා පිළිබඳව රාජ්‍ය පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත පුරප්පාඩු . ද්විතීය මට්ටමේ . 15 ක් සඳහා නවක උපාධිධාරීඅභ්‍යාසලාභී 10ක් මෙම පුරප්පාඩුවලට අනුයුක්ත කර ඇත. ප්‍රාථමික මට්ටමේ පවතින පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන කාර්යසාධන බලකා දෙපාර්තමේන්තුව වෙතින් ලිඛිත ඉල්ලීමක් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |